මගේ අංකය : ඩී16/විභාග/සීමිත/2025
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.

2026.09. 25

සියළුම බන්ධනාගාර අධිකාරීන් සහ සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත,

**බන්ධනාගාර නියාමක තනතුරට සීමිත ධාරාව යටතේ බඳවා ගැනීම (2025) 2026**

මෙම දෙපාර්තමේන්තුවේ පවතින නියාමක තනතුරේ පුරප්පාඩු සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/EST/07-07/01/2016 හා 2026.08.17 දිනැති ලිපිය අනුව මෙම වතාවට පමණක් අදාල වන පරිදි පහත සඳහන් සුදුසුකම් ඇති දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශ්‍රේණියේ නිලධරයන්ගෙන් සහ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සේවය කරන ඒකාබද්ධ සේවයේ ප්‍රාථමික ශ්‍රේණියේ නිලධරයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අධ්‍යාපන සුදුසුකම් : 08 ශ්‍රේණිය / 09 වසර සමත් වීම

කායික සුදුසුකම් :
I. අවම උස අඩි 05 අඟල් 02 (පිරිමි)
II. අවම උස අඩි 05 (කාන්තා)
III. පිරිමි අයදුම්කරුවන් සඳහා පපුව අඟල් 30ක් විය යුතුය.

02. අයදුම්පත් කැඳවීමේ නිවේදනය ඔබ ආයතනයේ සියළු දෙනාම දැනුවත් වන ලෙස ප්‍රසිද්ධ කර, අයදුම්පත් ලබා ගෙන, ඔබගේ නිර්දේශය ද සහිතව 2026.10.10 දිනට පෙර මා වෙත එවීමට කටයුතු කරන්න(වැටුප් වර්ධක උපයාගෙන ඇති බව පොදු 232 ආකෘති පිටපත් මගින් සනාථ කළ යුතුය.).

03. *අයදුම්පත් කැඳවීමේ නිවේදනය අනුව බලාපොරොත්තු වන කායික සුදුසුකම් (උස, පපුව), සේවා කාලය හා අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කර නොමැති නිලධාරීන් ඉල්ලුම් කිරීමෙන් වැළකී සිටිය යුතු අතර ඒ පිළිබඳව අයදුම්කරුවන් දැනුවත් කිරීමටද එවැනි අයදුම්කරුවන්ගේ අයදුම්පත්‍ර ඔබ විසින් නිර්දේශ නොකිරීමටද කටයුතු කරන මෙන් දන්වා සිටිමි.*

04. *නියමිත සුදුසුකම් සම්පූර්ණ කර නොමැති අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අදාල අයදුම්කරු සහ බන්ධනාගාර අධිකාරිවරයා / ආයතන ප්‍රධානියා පෞද්ගලිකවම වගකිව යුතු බව වැඩිදුරටත් දන්වමි.*

ආර්. ප්‍රසාද් හේමන්ත කුමාර
බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (රා.ආ.)
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

ආර්.ප්‍රසාද් හේමන්ත කුමාර
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්(රා.ආ)

## අයදුම්පත් කැඳවීමේ නිවේදනය

**බන්ධනාගාර නියාමක තනතුරට සීමිත ධාරාව යටතේ බඳවා ගැනීම (2025) 2026**

**01** මෙම දෙපාර්තමේන්තුවේ පවතින නියාමක තනතුරේ පුරප්පාඩු සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශ්‍රේණියේ නිලධරයන්ගෙන් සහ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සේවය කරන ඒකාබද්ධ සේවයේ ප්‍රාථමික ශ්‍රේණියේ නිලධරයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබෙ

**02. තනතුරෙහි කාර්ය භාරය**

බන්ධනාගාර ආයතනයන්හි පරිපාලනයට සහාය වීම සහ බන්ධනාගාරගත නේවාසිකයන්ගේ ආරක්ෂාව සැලසීම සහ ඔවුන් ආරක්ෂණය කිරීමට සහාය වීම

**03. තනතුරෙහි ස්වභාවය**

ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරකි. පත්වීම් ලබන්නන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය.

**04. මාසික වැටුප් පරිමාණය**

4.1 රු. 49,550 - 7 x 540 - 27 x 670 – 71,420 (RS 1- 2025) (2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හි විධිවිධාන වලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි රු. 49,550/- ට අනුරූපී ආරම්භක පියවරේ තබා වැටුප් ගෙවනු ලැබේ).

4.2 I වන කාර්යක්ෂමතා කඩඉම නියාමක තනතුරට පත් වී වසර 03 ක් ඇතුළත සමත් විය යුතුය.

4.3 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අනුෂංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

**05. බඳවාගැනීමේ සුදුසුකම්**

**5.1** අධ්‍යාපන සුදුසුකම් **:-** 08 ශ්‍රේණිය / 09 වසර සමත් වීම

**5.2 පළපුරුද්ද**

වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති, තනතුරෙහි ස්ථිර කර ඇති, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශ්‍රේණියේ නිලධරයකු විය යුතුය.

නැතහොත්

තනතුරෙහි ස්ථිර කර ඇති වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ අවම වශයෙන් වසර 03 ක් වත් සේවය කර ඇති ඒකාබද්ධ සේවයේ ප්‍රාථමික ශ්‍රේණියේ නිලධරයකු විය යුතුය.

**5.3 කායික සුදුසුකම්**

I. අවම උස අඩි 05 අඟල් 02 (පිරිමි)
II. අවම උස අඩි 05 (කාන්තා)
III. පිරිමි අයදුම්කරුවන් සඳහා පපුව අඟල් 30 ක් විය යුතුය.

✱ සතුටුදායක සේවා කාලය - රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XVII වන පරිච්ඡේදයේ 236 (i) හා (ii) වගන්ති වල සඳහන් කර ඇති පරිදි විය යුතුය.

**06. වයස් සීමාව** අදාළ නොවේ.

**07.** **බඳවා ගැනීමේ ක්‍රමය**

යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා මුළු ලකුණු වල කුසලතා අනුපිළිවෙළ අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

**08.** **යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය**

| ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| ප්‍රශංසා | 05 |
| ක්‍රීඩා | 10 |
| යහපත් සේවයට වාර්තා කිරීම | 05 |
| උසස් අධ්‍යාපන පුහුණුව | 05 |
| ජ්‍යෙෂ්ඨතාව | 20 |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 05 |
| එකතුව | **50** |

**09.** **ඉල්ලුම් කිරීමේ ක්‍රමය**

**9.1** මෙම නිවේදනයට අමුණා ඇති ඉල්ලුම් පත්‍රය අනුව ඉල්ලුම්පත සැකසිය යුතුය.

**9.2** නියමිත ආදර්ශ ආකෘතියට අදාළ නොවන අයදුම්පත්‍ර නිසි ලෙස සම්පූර්ණ නොකරන ලද හා නියමිත දිනට නොඑවන අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදු වන පාඩුව අයදුම්කරුවන් විසින් දරා ගත යුතුය.

**9.3** අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවර **"බන්ධනාගාර නියාමක තනතුරට සීමිත ධාරාව යටතේ බඳවා ගැනීම (2025) 2026"** යන්න සඳහන් කළ යුතුය.

සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය 2026.10.10 දින හෝ ඊට ප්‍රථම **ආයතන ප්‍රධානියා මගින්** පහත ලිපිනයට එවිය යුතුය.

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
ආයතන ශාඛාව,
බන්ධනාගාර මූලස්ථානය,
අංක 150, බේස්ලයින් පාර,
කොළඹ 09.

මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියළු අයදුම්කරුවන් මෙහි සඳහන් පොදු නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

**ආර්. ප්‍රසාද් හේමන්ත කුමාර**
**බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (රා.ආ.)**
**බන්ධනාගාර මූලස්ථානය**
**කොළඹ 09.**

ආර්.ප්‍රසාද් හේමන්ත කුමාර
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්(රා.ආ)

**බන්ධනාගාර නියාමක තනතුරට සීමිත ධාරාව යටතේ බඳවා ගැනීම (2025) 2026**
**ආදර්ශ අයදුම්පත්‍රය**

01 i. සම්පූර්ණ නම : ..........................................................................................................
ii. මුලකුරු සමග නම : ..........................................................................................................

02. තනතුර : ..........................................................................................................

03. i. ස්ථිර තනතුරට පත්වූ දිනය : .........................................................
ii. 2026.10.10 දිනට සේවා කාලය : ...................................................
iii. ඒකාබද්ධ සේවයේ නිලධාරියකු නම් බන්ධනාගාර මූලස්ථානයේ සේවය කර ඇති කාලය(අවු) : ....
.......................................... දින සිට ................................... දින දක්වා

04. තනතුරෙහි ස්ථිර කර තිබේද : ................................................

05. උපන්දිනය : ................................................2026.10.30 දිනට වයස : .......................................

06. ස්ත්‍රී / පුරුෂ භාවය : .......................................

07. අධ්‍යාපන සුදුසුකම් (ලබා ඇති ඉහළම සුදුසුකම සඳහන් කරන්න) : ..................................................
එම සුදුසුකම ලබා ගත් වර්ෂය : ...................................

08. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්නයේ වසර 03 ඇතුළත අවවාද කිරීමකට වැඩි දඬුවමක් ලබා තිබේද සහ විසඳීමට විනය පරීක්ෂණ ඇත් ද යන වග : ..........................................................
..........................................................................................................................

09. i උස : අඩි - ............... අඟල් - ...............
ii පපුව : අඟල් - ............... (පිරිමි අයදුම්කරුවන් සඳහා පමණි)

10. යහපත් සේවයට වාර්තා කිරීම (දින ගණන) :

2021.01.01 - 2021.12.31 - දින .....................
2022.01.01 - 2022.12.31 - දින .....................
2023.01.01 - 2023.12.31 - දින .....................
2024.01.01 - 2024.12.31 - දින .....................
2025.01.01 - 2025.12.31 - දින .....................

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

...............................
දිනය : ............................ අයදුම්කරුගේ අත්සන

**බන්ධනාගාර අධිකාරීගේ/ආයතන ප්‍රධානියාගේ නිර්දේශය :**

.......................................................................................... නිලධරයා ................................ දින සිට මෙම දෙපාර්තමේන්තුවේ ස්ථිර ...................................... තනතුරෙහි සේවය කරන බවත්, 2026.10.10 දිනට පූර්වාසන්නයේ නියමිත වැටුප් වර්ධක 05 ක් උපයාගෙන ඇති/ නැති බවත්, සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති/ නැති බවත් සහතික කරමි.

වැටුප් වර්ධක ලබා ගෙන ඇති බවට පොදු 232 ආකෘති පිටපත් අමුණා ඇත.
නිලධාරියාගේ අයදුම්පත නිර්දේශ කරමි/ නොකරමි.
(අදාල නොවන වචන කපාහැර අධිකාරි විසින් නියමිත පරිදි සම්පූර්ණ කල යුතුයි.)
(නිර්දේශ කරනු නොලබන්නේ නම් හේතුව සඳහන් කරන්න.)..........................................................
..........................................................................................................................

...................................
දිනය : බන්ධනාගාර අධිකාරි